# ප්‍රසම්පාදන දැන්වීම

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ

## වායු රයිෆල් 150 මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

### ප්‍රසම්පාදන අංකය - DSM/ACC/10/NCB/2025/09

මෙම කාර්යාලයේ දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා මාතලේ දිස්ත්‍රික්කයේ වගා හානි අවම කිරීමේ අරමුණින්, ප්‍රතිලාභීන් 150 වෙත බෙදා දීම සඳහා ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ වායු රයිෆල් 150 මිලදී ගැනීමට මිල ගණන් කැඳවනු ලැබේ.

02. ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන 2025.10.07 වන දින සිට 2025.10.21 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 තෙක් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත රු. 1,500/- ක ආපසු නොගෙවන මුදලක් ගෙවා ලබාගත් රිසිට් පතක් හා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ගිණුම් අංශයෙන් ලබාගත හැක.

03. ලංසු සුරක්ෂණය **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ"** නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් ඉහත සඳහන් වටිනාකමින් යුත් 2026.01.20 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් එවිය යුතු අතර, එසේ නොමැති නම් එම වටිනාකම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් තැම්පත් කිරීමෙන් සිදු කළ හැක.

04. ලංසුකරු විසින් ලංසු පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව කවරවල බහා පසුව තනි කවරයක් ලෙස (මිල ගණන් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ප්‍රසම්පාදන අංකය හා කොන්ත්‍රාත්තුවේ නම පැහැදිලිව ලියා තිබිය යුතුය) සකස් කර 2025.10.22 දින පෙ.ව. 2.30 ට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතුය.

05. 2025.10.22 දින ප.ව. 2.30 ට ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේදී ටෙන්ඩර් පෙට්ටිය වැසීම සිදු කර එසැනින් ලංසු විවෘත කිරීම සිදු කරන බැවින්, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

06. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් හා වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරී දුරකථන අංක 066-2230222 මගින් අමතා ලබා ගත හැකිය.

**දිස්ත්‍රික් ලේකම් / ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**මාතලේ.**